# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/15/sw-2-01

ඔබේ අංකය / உமது இல / Your No: ........................

දිනය / திகதி / Date: 2023.01.18

සියළුම ප්‍රජාමූල විධායක කමිටු / බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්
සියළුම සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමණාකරුවන්

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ක්‍රියාත්මක වන පරිගණක මෘදුකාංගය සඳහා සර්වර් පහසුකම් සැපයිම වෙනුවෙන් සේවා ගාස්තු එකවර ගෙන්වා ගැනිම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක 2022.10.31 දිනැති උපදෙස් ලිපිය හා බැඳේ.

එකි ලිපියෙන් 2022 මාර්තු සිට දෙසැම්බර් දක්වා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල ක්‍රියාත්මක පරිගණක මෘදුකාංග පද්ධතියට අදාල සර්වර් ගාස්තු ලෙස රු. 46507.40 ක් මුදලක් එකවර චෙක්පතකින් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලෙසත් 2023 වර්ෂයේ සිට මාසිකව අදාල ගාස්තු එවන ලෙසත් දන්වා ඇත.

එහෙත් ඇතැම් බැංකු හා බැංකු සමිති 2022 වර්ෂයට අදාල එම සර්වර් ගාස්තුව නියමිත පරිදි ප්‍රධාන කාර්යාලයට මෙතෙක් ලබා නොදිම නිසා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට නිසි පරිදි අදාල මාසිකව සර්වර් ගාස්තු ගෙවිමට නොහැකි වි ඇත. එබැවින් එම ආයතනයෙන් අඛණ්ඩව සේවාව ලබා ගැනිම ගැටළු සහගත තත්ත්වයකට පත්ව ඇත.
එම තත්ත්වය වලක්වා ගැනීම සඳහා, 2023 වර්ෂයට අදාල මාසික සර්වර් ගාස්තු එකවර ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ගෙන්වා ගැනීමට තීරණය කර ඇත. එබැවින් <u>2023 වර්ෂයට අදාල බදු මුදල් ද ඇතුළුව මුළු මුදල ලෙස රු.59300.00 ක් 2023.01.25 දිනට පෙර 2022 වර්ෂයේ දි ඇති උපදෙස් පරිදි බැංකු සමිතියට ලබාදිය යුතුය.</u>

තවද 2022 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට වැට් බදු ප්‍රතිශතය 12% සිට 15% දක්වා ඉහල නැංවීම නිසා නව බදු අනුපාතයට ගැලපිම සහ අලුතින් ක්‍රියාත්මක වූ සමාජ ආරක්ෂණ බදු අනුපාතය 2.5% යන හිඟ බදුවලට අදාල මුදල් ද ඇතුලත් කර 2023 වර්ෂයේ ගෙවිය යුතු රු.59300 .00 සර්වර් ගාස්තුව සකස් කර ඇති බව දැනුම් දෙමි.

බැංකු සමිතිය විසින් බැංකුවලින් එවන ලද මුදල සහ තම බැංකු සමිතියේ සර්වර් ගාස්තුව ද එකතු කර <u>කළමනාකරු, ලංකා බැංකුව බත්තරමුල්ල ප්‍රජාමූල බැංකු අංශය - ආයෝජන ගිණුම ජ.ගි.3417925</u> ට එක් චෙක්පතකින් මුදල් එවා ඇති බැංකුවල නාමලේඛණයද සමග 2023.01.31 දිනට පෙර ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවිය යුතු වේ. මීට අදාල ගිණුම් සටහන් සම්බන්ධව 2022.10.31 දින නිකුත් කරන ලද 2022/15 අංක දරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි තැබිය යුතුය.

තවද මෙම කාර්යය අත්‍යාවශ්‍ය හා ප්‍රමුඛ කාර්යයක් සේ සලකා අදාල දිනට පෙර චෙක්පත එවිමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එස්.ඒ.එස්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) රා.ඉ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත්

1. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ග.ස.
2. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දැ.ග.ස.
3. අධ්‍යක්ෂ , සමෘද්ධි බැංකු මහා සංගම් අංශය - දැ.ග.ස
4. සහකාර අධ්‍යක්ෂ , තොරතුරු තාක්ෂණ - දැ.ග.ස


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |